# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1998 අංක 56 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1998 දෙසැම්බර් මස 08 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 දෙසැම්බර් මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 9.00 යි. තැපැල් ගාස්තුව : රු. 4.60 යි.

**1998 අංක 56 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1998 දෙසැම්බර් මස 08 වන දින.]

එල්.ඩී.–ඕ. 58/94.

**1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 56 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ 28 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය, ප්‍රධාන ප්‍රඥප්තියේ 28අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— 1983 අංක 24 දරන පනතේ 28අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"ඇතැම් අවස්ථාවල දී සියලු දායක මුදල් ආපසු ගෙවීම.

28අ. (1) මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුවද, මේ වගන්තිය ක්‍රියාත්මක වීමේ දී හෝ ඉන් පසුව, දරුවන් නොමැති වැන්දඹුවක් වූ දායිකාවක්—

(අ) විශ්‍රාම වැටුප් මත රජයේ සේවයෙන් විශ්‍රාම ලබන ; හෝ

(ආ) ඉල්ලා අස්වීමෙන් හෝ අන්‍යාකාරයකින් රජයේ සේවයෙන් ඉවත්ව යන ; හෝ

(ඇ) රජයේ සේවයේ සිටිය දී මිය යන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ දායිකාව හෝ ඒ දායිකාවගේ නීත්‍යානුකූල නියෝජිතයා, ඇගේ සියලුම දායක මුදල්, ඒ මත වර්ෂයකට සියයකට දෙකාමාරක වැල් පොලිය ද සමග, ආපසු ලබා ගැනීමට හිමිකම් ලබන්නේ ය :

එසේ වුවද, වයස අවුරුදු පණස් පහට පත්වීමට පෙර රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ හෝ ඉවත් වී ගිය දායිකාවක්, ඇය ඒ වයසට පත්වනතෙක් ඒ මුදල් ආපසු ලැබීමට හිමිකම නොලබන්නී ය.

1—D 049836— 1,000(98/09)

(2) මේ වගන්තිය යටතේ මුදල් ආපසු ගෙවීමක් ලබන යම් දායිකාවකට අරමුදලින් තවදුරටත් හිමිකම් පෑමක් කළ නොහැකි විය යුතු ය.

(3) මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුවද, මේ වගන්තිය ක්‍රියාත්මක වූ දිනයට පෙරාතුව, යම් දායක මුදල් ආපසු ගෙවීමක් ලබාගත් (1) වන උපවගන්තියේ සඳහන් යම් දායිකාවක් විසින් ආපසු ලබාගත් ඒ මුදල් ප්‍රමාණය වර්ෂයකට සියයට දෙකහමාරක වැල් පොලිය ද සමග, එකී දින සිට එක් වර්ෂයක් ඇතුළත ආපසු ගෙවනු ලබන්නේ නම් පමණක් ඇය විසින් මේ වගන්තියේ වාසිය සඳහා වූ හිමිකම් පෑම කළ හැකි ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.